# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2319/16 - 2023 පෙබරවාරි මස 13 වැනි සඳුදා - 2023.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : DS/V/LB/Ves/Army/2012
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/4/2012/D/71.

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම/භුක්ති අයිතිය පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ලබා ගැනීමට රජය අදහස් කරන බවත්, 1964 වර්ෂයේ අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනත යටතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ මම මෙයින් දන්වා සිටිමි.

*අත්කර ගැනීමට නියමිත ඉඩමේ හෝ භුක්ති අයිතිවාසිකමේ විස්තරය :*

උතුරු පළාතේ, වවුනියාව දිස්ත්‍රික්කයේ, වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුන්ඩුමුරිප්පු ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තච්චන්කුලම් ගමේ පිහිටා ඇති සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක PP ව 345 හා 2018.12.19 දින දරන මූලික පිඹුරෙහි සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4047 පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටා ඇති ඉඩම;

01. කැබලි අංක 01

ඉඩමේ නම : තච්චන්කුලම්; හිමිකම් කියන්නා : මාසිලාමණි සන්මුගදාසන්, තිරුනෙල්වේලි, යාපනය; අත්පත් කරගැනීමේ අරමුණ: 211 වැනි සේනාංක මූලස්ථානය (වන්නි) ස්ථාපිත කිරීම; ප්‍රමාණය : හෙක්ටයාර් 0.4047

*මායිම්* :

*උතුරට* : පී.පී.එස්. 155 පිඹුරේ කැබලි අංක 75; *නැගෙනහිරට* : පී.පී.එස්. 155 පිඹුරේ කැබලි අංක 69; *දකුණට* : පීපී.එස්. 155 පිඹුරේ කැබලි අංක 69 සහ කැබලි අංක 70; *බස්නාහිරට* : පී.පී.එස්. 155 පිඹුරේ කැබලි අංක 70 සහ කැබලි අංක 75.

ඉහත සඳහන් ඉඩමට/භුක්ති හිමිකම් අත්කර ගැනීමට නියමිත ඉඩමට හිමිකම් පාන සියළුදෙනාම තමන්ම හෝ විධිමත් ලිඛිතව බලය පවරන ලද නියෝජිතයකු මගින් 2023 වර්ෂයේ මාර්තු මාසයේ 27 වන දින පෙරවරු 10.00 ට වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රැස්වීම් ශාලාවේ දී මා ඉදිරිපිට ප්‍රකාශ කරන ලෙසද එම ඉඩම පිළිබඳව ඔහුට ඇති හිමිකම්වල ස්වභාවය ද දක්වා ඇති ඉඩමේ භුක්ති අයිතිවාසිකම අත්කර ගැනීමේ වන්දි පිළිබඳව ඔවුන්ගේ ඉල්ලීම්වල විස්තර ද වන්දි මුදල ද එම මුදල ගණනය කළ විස්තර ද 2023 වර්ෂයේ මාර්තු මස 20 වන දිනට පෙර ලිඛිතව පිටපත් තුනකින් (03) යුක්තව මා වෙත දන්වන ලෙසද මෙයින් ඉල්ලා සිටිමි.

**එන්. කමලදාසන්,**
ප්‍රාදේශීය ලේකම්,
වවුනියාව.

2023 පෙබරවාරි මස 07 වැනි දින,
වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02-0134